# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1349/10 – 2004 ජූලි 14 වැනි බදාදා – 2004.07.14

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත**

වරාය හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින්, 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 39 වන වගන්තිය යටතේ පනවනු ලබන නියෝග.

මංගල සමරවීර,
වරාය හා ගුවන් සේවා අමාත්‍ය.

2004 ජූලි මස 09 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2004 ගාස්තු නිශ්චය කිරීම පිළිබඳ නියෝග, යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. අධිකාරිය විසින් (මේ ඡේදයේ "නෛතික බලකරයක්" යනුවෙන් හඳුන්වනු ලබන) යම් බලපත්‍රයක්, සහතිකයක්, අවසර පත්‍රයක් හෝ වෙනත් බල පැවරුමක් නිකුත් කිරීම හෝ ප්‍රදානය කිරීම සඳහා අය කරනු ලැබිය හැකි ගාස්තු නිශ්චය කිරීමේදී සහ එසේ නිකුත් කරන ලද හෝ ප්‍රදානය කරන ලද බලපත්‍රයක්, සහතිකයක්, අවසර පත්‍රයක් හෝ වෙනත් බල පැවරුමක් අලුත් කිරීම හෝ සංශෝධනය කිරීම සඳහා, අය කරනු ලැබිය හැකි ගාස්තු නිශ්චය කිරීමේදී පහත සඳහන් මෙහෙයුම් නිර්ණායකයන් සැලකිල්ලට ගනු ලැබිය යුතුය :—

(අ) නෛතික බලකරයක් නිකුත් කිරීමට හෝ ප්‍රදානය කිරීමට අපේක්ෂා කරනු ලබන මෙහෙයුමේ ස්වභාවය සහ විෂය පථයන්, නිකුත් කරන හෝ ප්‍රදානය කරන එවැනි බලකරයක් අවශ්‍ය වනු ලබන්නේ කවර කාල පරිච්ඡේදයක් සඳහා ද යන්නත්,

(ආ) එවැනි නෛතික බලකරයක් නිකුත් කිරීමට හෝ ප්‍රදානය කිරීමට ප්‍රථම, සමාලෝචනයට භාජන කරනු ලැබීමට අවශ්‍යවන ලේඛනවල ස්වභාවය හා විෂය පථය, සුදුසුකම් පිළිබඳව ඇගයීමකට ලක් කරනු ලැබීමට සිදුවන සේවක පිරිස් සංඛ්‍යාව සහ පරීක්ෂා කරනු ලැබීමට සිදුවන පරිශ්‍රයන්, පහසුකම් හා උපකරණ ;

(ඇ) එවැනි නෛතික බලකරයක් නිකුත් කිරීමට හෝ ප්‍රදානය කිරීමට අදාළ වන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන කාලය ;

(ඈ) එවැනි නෛතික බලකරයක් නිකුත් කිරීමට හෝ ප්‍රදානය කිරීමට ප්‍රථම කළ යුතු වූ සනාථ කිරීමේ ගුවන් ගමන් සංඛ්‍යාව සහ එවැනි ගුවන් යානා වර්ග ; සහ

(ඉ) එවැනි නෛතික බලකරයක් නිකුත් කිරීමෙන් හෝ ප්‍රදානය කිරීමෙන් අනතුරුව, ඒ හා සම්බන්ධ වන ඉදිරි කටයුතු හා සංශෝධන ක්‍රියාවලිය සහ නෛතික බලකරය අවස්ථාවෝචිත පරිදි නිකුත් කිරීම හෝ ප්‍රදානය කිරීම කළ දිනයේ සිට හෝ අවසන් වශයෙන් අලුත් කරන ලද දිනයේ සිට, ගතවී තිබෙන කාල පරිච්ඡේදය.

3. අධිකාරිය විසින් සපයනු ලබන යම් සේවාවක් සඳහා අයකරනු ලබන ගාස්තු නිශ්චය කිරීමේදී පහත සඳහන් මෙහෙයුම් නිර්ණායකයන් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය :—

(අ) සේවාව සැපයීම සඳහා භාවිත කරනු ලැබූ සම්පත්වල ස්වභාවය සහ විෂය පථය ;

(ආ) සේවාව ලබා දෙනු ලැබූ වාර ගණන ;

(ඇ) සේවාව ලබා දිය යුතු වූ ස්ථානය හෝ ස්ථාන ;

(ඈ) සේවාව ලබා දීම සඳහා අවශ්‍ය ගමනාගමන පිළිවෙල සහ ආකාරය ;

(ඉ) මෙරටේ සිවිල් ගුවන් සේවා අංශය සම්බන්ධයෙන් පිරිනමනු ලබන සේවාවේ ඇති වටිනාකම ;

(ඊ) සේවාව සැපයීමේදී අධිකාරිය වෙත පැවරෙන යුතුකම්, වගකීම් හෝ අධිකාරිය වෙත බලපෑ හැකි අනතුරුදායක තත්වයේ ස්වභාවය සහ විෂය පථය ; සහ

(උ) සේවාව සැපයීමේදී අධිකාරිය විසින් ඉටු කරනු ලබන වෙනත් යම් කාර්යයක ස්වභාවය, විෂය පථය හා ප්‍රමාණය.

4. මේ නියෝගයන්හි "අධිකාරිය" යන්නෙන් 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය අදහස් වේ.

07-739

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.